# ගණිකාව සහ ඔසප්, ඔසප්, ඔසප්






රසික සූරියආරච්චි

අප සියළු දෙනා බහ තෝරන්නේ ළදරු අවදියේ දී අපේ නිවෙස්වල දෙමව්පියන්, සොහොයුරන්, සොහොයුරියන් සහ ඥාතීන් අතර සිටියදී බව සැබෑවකි. ඊළඟට පාසලට යන අප එහිදී ගුරුවර ගුරුවරියන් ගේ මග පෙන්වීම යටතේ භාෂාව නිසි ලෙස හදාරමු.

එනමුත්, අප දන්නා වචන සහ යෙදුම් සියල්ල ඉගෙන ගන්නේ නිවසේ දී හෝ ගුරුවරුන්ගෙන් හෝ යැයි කීම සත්‍යයක් නොවේ.

විශේෂයෙන්ම, අප දන්නා තිත්ත කුණුහරුප සහ වෙනත් නොයෙකුත් අසභ්‍ය දේ ඉගෙන අප ගත්තේ බොහෝවිට මිතුරන්ගෙනි, ඇතැම්විට සතුරන්ගෙනි, පොදුවේ අප වෙසෙන සමාජයෙනි. එකී තිත්ත කුණුහරුප සහ අසභ්‍ය කතා ගණයේ ලා සැලකිය නොහැකි වුවද, කුඩා ළමයින්ට නොගැලපේ යැයි සමාජය විසින් පොදුවේ සලකන තහනම් වචන රාශියක් ද වේ. ඒවායේ ඇති නොගැලපෙන බව නොහොත් තහනම කාලයත් සමගම නැතිවී යයි.

මා කුඩා කාලයේ කියවූ ගණිකාව යන වචනය එවැන්නකි.

මගේ මව විසින් කියවීම පිණිස මිළට ගත්, ඒ දිනවල, එනම් හැටේ දශකයේ අවසාන භාගයේ සහ හැත්තෑව දශකයේ මුල් භාගයේ, ප්‍රසිද්ධ ප්‍රකාශනයක් වූ රසකතා නමැති සතිපතා පත්‍රයේ පලවූ කෙටි කතාවක තිබී මම ඒ වචනය මුලින්ම කියවූයෙමි.

ඒ මා තුන්වෙනි ශ්‍රේණියේ හෝ සිව්වෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටි අවදියේ ය. ඒ දිනවල තේරුම නොදන්නා ඕනෑම වචනයකට අප කීවේ අමාරු වචනයක් කියාය. ඉංගිරිසි අමාරු වචනවල තේරුම දැන ගන්නට අවශ්‍ය වූ විට එය සොයා බලන්නට ඉංගිරිසි*සිංහල ශබ්ද කෝෂ තිබේ. ඒත් සිංහල වචනයක තේරුම නොදන්නේ නම් අපට ඒ දිනවල තිබුණු එකම විසඳුම දන්නා අයෙකුගෙන් ඇසීමයි.
මා තාත්තා ගෙන් "තාත්තේ, ගණිකාව කියන්නේ මොකක්ද?" කියා ඇසුවේ ඒ නිසාය.

"උඹ මොකක්ද ඔය කියවන්නේ?" තාත්තා ගේ පිළිතුර වූයේ එයයි.

"මේ රසකතා පත්තරේ!" කෙටිකතාවක් මම උත්තර දුන්නෙමි.

පත්තරය මගේන උදුරාගත් තාත්තා, කුස්සියේ උයමින් සිටි අම්මා වෙතට ගියේය.

"මොකට සල්ලි දීලා ගන්නවද මේ කුණුහරුප පත්තර? මේ ළමයින් නරක් වෙනවා මේවා කියවලා" තාත්තා අම්මාට බැණ වැදුණේ එසේය.

තාත්තා ගණිකාව යන වචනයේ තේරුම මට කිසි දිනක කියා දුන්නේ නැත. පෙර කී බැණුමට සවන් දී සිටි මම ඒ වචනය කුණුහරුපයක් බව
සිතා ගත්තෙමි.

ගණිකාව යන්න කුණුහරුපයක් නොවෙන බව අමුතුවෙන් කිව යුතුව නැත. මා විසින් සිදුකර තිබුණු වරද වූයේ හතරේ පන්තියේ ළමයෙකු ගේ වයසට නොගැලපෙන ප්‍රකාශනයක් කියවීමයි.

මින් වසරකට පමණ පසු කාලයක මඩොල්දූව ළමා නවකතාව කියවද්දී උපාලි ගිනිවැල්ලේ ට කාමේසු මිච්චාචාරා යන්න පැහැදිලි කර නොදෙන ඉස්කෝලේ මහත්තයා එය කුණුහරුපයක් යැයි සිතා ගැනීමට ඉඩ දෙන අයුරු මා දුටුවෙමි.

එහි ඇති සරදම නම් මගේ තාත්තා ද වෘත්තියෙන් ගුරුවරයෙක් වීමයි. මේ දිනවල අප නිවසට ගන්නා සිළුමිණ, රිවිරැස යනාදී සති අන්ත පුවත්පත්වල ළමා පිටු පමණක් නොව අනෙකුත් ලිපි සහිත පිටු ද හැකි අයුරින් කියවීමට මම පුරුදු වී සිටියෙමි. මෙවැනි සති අන්ත පුවත්පත්වල තිබුණු එක් අනිවාර්ය අංගයක් වූයේ ලුහුඬු දැන්වීම් තීරයයි.

එක් දිනයක මෙවැනි ලුහුඬු දැන්වීම් තීරයක තිබී මා ඇස ගැටුනේ මේ ආකාරයේ දැන්වීමකි.

*ඔසප් ඔසප් ඔසප්*

*කාන්තාවන් ගේ ඔසප් රෝග*
*ඔබේ ඔසප් වීම මාස දෙකකින් තුනකින් පමා*
*වූවත් එය නිට්ටාවටම සුවකර දෙමි.*
*හරි ගිය පසු ගාස්තුව ගෙවන්න.*
*ප්‍රතිකාර කිරීම වෙද නිවසේ දී පමණයි.*
*වෙනත් ශාඛා නොමැත.*
*විමසන්න!*
*පාරම්පරික වෛද්‍යාචාර්ය බ්‍රිම්පි සිඤ්ඤෝ*
*මයා*
*ගොඩපොර ගස් හන්දිය*
*තෝන්තුවාව*

මෙහි එන ඔසප් යන වචනය මට අමාරු වචනයක් විය.

නමුත් කුමක් දෝ අපැහැදිලි හේතුවක් නිසා මම එහි තේරුම කිසිම ආකාරයකින් දෙමව්පියන්ගෙන් හෝ අපේ පන්තිය බාර ගුරුවරියගෙන් හෝ නොඅසා ඉන්නට තීරණය කළෙමි.

මා ඔසප් වීම යන්නෙහි තේරුම දළ වශයෙන් හෝ දැනගත්තේ මින් වසර තුනකට පමණ පසු වෙනත් නවකතාවක් කියවද්දී ය.

පෙරකී ලුහුඬු දැන්වීම් තීරයේම තිබුණු තවත් දැන්වීමක හෙඩිම මේ මොහොතේ මගේ මතයකයට එයි.

*අර්ශස්! අර්ශස්!! අර්ශස්!!!*

rasika.suriyaarachchi@gmail.com




